**මොරටුව විශ්වවිද්‍යාලය - 2020**

**------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**----------------**

### 1.1 මතය

**------**

මොරටුව විශ්වවිද්‍යාලයේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමග සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**----------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

**----------------------------------------------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, විශ්වවිද්‍යාලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය විශ්වවිද්‍යාලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

විශ්වවිද්‍යාලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, විශ්වවිද්‍යාලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා විශ්වවිද්‍යාලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.
- මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.
  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ විශ්වවිද්‍යාලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත්

ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ විශ්වවිද්‍යාලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, විශ්වවිද්‍යාලය ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපන ආයතන සඳහා වූ ආයතතන සංග්‍රහයේ XX පරිච්ඡේදයේ 3.1 වගන්තිය | විශ්වවිද්‍යාල ආයතන සංග්‍රහයට පටහැනිව අධ්‍යයන කාර්ය මණ්ඩලයේ පැමිණීම හා පිටවීම සනාථ කර ගැනීමකින් තොරව සමාලෝචිත වර්ෂය සඳහා රු. 1,459,550,041 ක් වැටුප් හා දීමනා ලෙස ගෙවා තිබුණි. | මුළු විශ්වවිද්‍යාල පද්ධතිය තුළම සිදුවන්නේ මෙම ක්‍රමවේදය වන බැවින් මොරටුව විශ්වවිද්‍යාලය තුල ද එම ක්‍රමවේදය ක්‍රියාත්මක බව කාරුණිකව දන්වමි. | අදාල නීති,රීති අනුව කටයුතු කළ යුතුය. |
| (ආ) 2003 ජුනි 02 දිනැති අංක 12 දරන පොදු ව්‍යාපාර පිළිබඳ චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂයට අදාල සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2020 වසර සඳහා වූ ක්‍රියාකාරී සැලැස්ම 2020 වර්ෂයේ ආරම්භයේදීම පිළියෙළ කරනලද නමුත්, පසුගිය වසර තුළ කොවිඩ් වසංගතය නිසා පවතින ලද සේවක ගැටළු නිසා මගහැරීමකින් පාලක සභා අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට නොහැකි වී ඇත. ප්‍රසම්පාදන සැලැස්ම පිළියෙල කිරීම කොවිඩ් තත්වය නිසා ඇතිවුනු සේවක හිගය මත ප්‍රමාද වීමට ලක්වුණි. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | විශ්වවිද්‍යාලය සතුව පවතින ස්ථාවර වත්කම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොතිබුණි. | ආයතනය සතුව පවතින ස්ථාවර වත්කම් සම්බන්ධ විස්තර ඇතුළත් කරමින් ස්ථාවර වත්කම් ලේඛනයක් පරිගණක පද්ධතියක් ආශ්‍රයෙන් පවත්වාගෙන යන අතර විගණන නිලධාරීන්ට අවශ්‍ය ඕනෑම අවස්ථාවක මුදල් අංශය වෙත ගොස් එය පරීක්ෂා කළ හැකිය. | අදාල චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

## 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 258,401,205 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.740,367,945 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.481,966,740 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී පුනරාවර්තන වියදම් වෙනුවෙන් රජයේ ප්‍රදාන ලැබීම් රු.118,080,000 කින් වැඩි වීම, වාර්ෂික පාරිතෝෂික වියදම රු. 334,841,215 කින් හා ගිවිසුම්ගත සේවා වියදම රු. 60,616,375 කින් පහළ යාම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

## 3.1 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | යුනි කන්සල්ටන්සි සමාගමට නෛතික රාමුවක් ඇතිකර ගැනීම සඳහා පොදු ව්‍යාපාර කාරක සභාව විසින් විශ්වවිද්‍යාලයට කැබිනට් අනුමැතියක් ලබා ගන්නා ලෙස නියෝග කර ඇති නමුත් වාර්තාවේ දිනය දක්වාම කැබිනට් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඒ සම්බන්ධයෙන් විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව මගින් කටයුතු කරමින් පවතී .ඒ අනුව 2020 සැප්තැම්බර් මස වන විට අනුමැතිය සඳහා අමාත්‍යමණ්ඩල පත්‍රිකාව අමාත්‍යාංශයට යොමු කිරීමට නියමිතව ඇත. | කැබිනට් අනුමතිය ලබා ගැනීම කඩිනම් කළ යුතුය. |
| (ආ) | 2009 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය සඳහා Bachelor of Information Technology (BIT) පාඨමාලාව වෙනුවෙන් කළමනාකරණ ගාස්තුව ලෙස විශ්වවිද්‍යාලයට අයවියයුතු එකතුව රු. 35,186,922 ක මුදල ගිවිසුමේ පාර්ශවයක් නොවන UNI | මෙම CODL මධ්‍යස්ථානය ආරම්භයේ සිට විශ්වවිද්‍යාලයෙන් පිටත තාවකාලිකව ස්ථාන කිහිපයක පිහිටුවා තිබී ඇති අතර පසුව දැනට පවතින ස්ථානයේ ස්ථාපනය කර ඇත. මෙම තාවකාලික ස්ථාන අතර කාර්යාල | ගිවිසුම්වලට එළඹීමේදී හා ක්‍රියාත්මක කිරීමේදී විනිවිධභාවයකින් යුතුව කටයුතු කළ යුතුය. |

| | |
|---|---|
| Consultancy සමාගම වෙත ගෙවා තිබුණි. | උපකරණ හා ලිපිගොනු අස්ථාන ගත වී ඇතිබව වැටහේ. |

**3.2 අරමුදල් ඌන උපයෝජනය**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) 2020 දෙසැම්බර් 31 දිනට එකතුව රු.2,676,340 ක් වූ ශිෂ්‍යත්ව අරමුදල් 16 ක් වර්ෂ 03 සිට වර්ෂ 10 ක් තුළ කිසිඳු ශිෂ්‍යත්වයක් පිරිනැමීමකට කටයුතු නොකර ඌන උපයෝජිතව පැවතිණි. | මෙම ඌන උපයෝජිත ශිෂ්‍යත්ව අරමුදල් සම්බන්ධයෙන් විස්තරාත්මකව සොයා බැලීමට හා ඒවා ක්‍රියාකාරී තත්වයට පත් කිරීම සඳහා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | අරමුදල් අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කළ යුතුය. |
| (ආ) 2020 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයීය පාඨමාලා හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් 34 ක එකතුව රු.13,921,449 ක් වර්ෂයක් තුළ අක්‍රීයව පැවති අතර අරමුදල් 21 ක එකතුව රු. 6,074,585 ක් වර්ෂ 4 ක කාලයක සිට ඌන උපයෝජිතව පැවතුණි. | දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදල් 2020 වර්ෂයේ රටේ පැවති කෝවිඩ් වසංගත තත්ත්වය හමුවේ මාස කිහිපයක් විශ්වවිද්‍යාලය සම්පූර්ණයෙන්ම වසා තිබීමත්, අනෙකුත් මාස වලද අධ්‍යනාංශ පූර්ණ ධාරිතාවයෙන් ක්‍රියාත්මක නොවීමත් හේතුවෙන් මෙම අරමුදල් 2020 වර්ෂයේ අක්‍රියව පැතීමට හේතු විය. | අරමුදල් අදාල අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් වැය කළ යුතුය. |

**3.3 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාලයේ අනුමත අධ්‍යයන හා අනධ්‍යයන කාර්යමණ්ඩල හා තත්‍ය කාර්යමණ්ඩලය සැසඳීමේදී පුරප්පාඩු පිළිවෙලින් 321 ක් හා 232 ක් විය. අධ්‍යයන කාර්යමණ්ඩලයේ පැවති පුරප්පාඩු සම්පූර්ණ නොකිරීම හේතුවෙන් බාහිර කථිකාචාර්යවරුන් බඳවා ගෙන සමාලෝචිත වර්ෂය තුළ පමණක් රු.30,962,883 ක දීමනා ගෙවා තිබුණි. | අනධ්‍යයන කාර්යමණ්ඩලයේ පුරප්පාඩු පිරවීම සඳහා පුවත්පත් දැන්වීම් මගින් අයදුම්පත් කැඳවන ලද නමුත් විවිධ හේතූන් මත විශ්වවිද්‍යාලය වසා දැමීම හේතුවෙන් අදාල වලංගු කාලය ඉක්මවා ගොස් ඇත. නැවත දැන්වීම් පළ කිරීමට කටයුතු යොදා ඇත.<br>නාමලේඛන ලැබී ඇති තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාවලිය ආරම්භ කර ඇත.<br>අදාළ අංශ වල අවශ්‍යතාවය අනුවත්, අංශ ප්‍රධානීගෙ ඉල්ලීම් වලට අනුවත් පිරවීමට කටයුතු කරනු ලබන අතර අදාල තනතුර සඳහා සුදුසුකම්ලත් ඉල්ලුම්කරුවන් ඉල්ලුකර නොමැති වීමෙන් අදාල පුරප්පාඩු පිරවීමට නොහැකි වන අතර එවිට අධ්‍යයන කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා බාහිර කථිකාචාර්යවරුන්ගේ සේවය ලබාගැනීම කරනු ලැබේ. | අවශ්‍යතාවය ඇති තනතුරු වල පුරප්පාඩු පිරවීමට කඩිනමින් පියවර ගත යුතුයි. |